# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 18 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කලේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.50 යි.** තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2002 අංක 18 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

එල්. ඩී.–ඕ. 7/2001.

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත සංශෝධනය කිරීම සඳහා සහ එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

1. මේ පනත 2002 අංක 18 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1972 අංක 10 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනතේ දීර්ඝ නාමයෙහි "නැව් නියෝජිතයකුගේ ව්‍යාපාරය" යන වචන වෙනුවට "නැව් නියෝජිතයකුගේ, නැව් බඩු ගෙන යන්නකුගේ, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් ගේ සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාර" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත සහ නැව් නියෝජිතයන් යන යෙදුම් නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන් ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම් කරුවන්ට බලපත්‍ර දීමේ පනත සහ නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම් කරුවන් යනුවෙන් පිළිවෙලින් හඳුන්වනු ලැබිය යුතු බව.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක-

(අ) "නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත" යන වචන වෙනුවට "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත් ලබාදීමේ පනත" යන වචන ;

(ආ) "නැව් නියෝජිතයන්" යන වචන වෙනුවට "නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්" යන වචන

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත" සහ "නැව් නියෝජිතයන්" යන වචනවලට කරන ලද සෑම සඳහනක්ම පිළිවෙලින් "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත"

සහ "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට කරන ලද සඳහනක් ලෙස පිළිවෙලින් කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "උචිත බලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"කන්ටේනර් මෙහෙයුම්කරුවන්" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ කන්ටේනර් පර්යන්තවල, කන්ටේනර් ඩිපෝවල සහ කන්ටේනර් නැව් බඩු තබා ඇති ස්ථාන මෙහෙයවීමේ ව්‍යාපාරවල යෙදී සිටින තැනැත්තකු අදහස් වේ.

"නැව් බඩු ගෙනයන්නන්" යන්නෙන්, නැව් බඩු රැගෙන යාම හෝ නැව් බඩු ගුවන් මගින්, මුහුදින් හෝ ගොඩබිමින් රැගෙන යාම ද ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් නැව් බඩු ගෙනයාමේ සහ එසේ රැගෙන යාමට සම්බන්ධ වෙනත් සේවා සපයන ව්‍යාපාරවල යෙදී සිටින තැනැත්තකු අදහස්වන නමුත් යම් ගුවන් සේවාවක හෝ නැව් හිමියකුගේ නැතහොත් නැවක් කුලියට ගත් තැනැත්තකුගේ නියෝජිතයකු ලෙස පමණක් භාණ්ඩ සහ සේවා සලසන තැනැත්තකු වශයෙන් සලසනු ලබන යම් සේවයක් ඊට ඇතුළත් නොවේ :

(2) "බලපත්‍රය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්" යන්නෙන්, යාත්‍රාවක කටයුතුවලද යෙදී සිටින නැව් බඩු ගෙන යන්නකු අදහස් වේ.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.